**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය - 2022**

**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන්උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත්"මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළදී රජයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ලැබී තිබුණු රු.32,420,000 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගැනීමට හා ගැලපීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පරීක්ෂාකර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී ඇලුමිනියම් කබඩ් සවි කිරීම සඳහා ගෙවන ලද රු1,481,639. ක්, දේපළ පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කිරීම වෙනුවට අයභාර වියදමක් ලෙස ලාභයට එරෙහිව කපා හැරීම නිසා ප්‍රවර්තන වර්ෂයේ ලාභය හා දේපළ පිරියත හා උපකරණ වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | විගණන අංශයෙන් පෙන්වාදුන් පරිදි මෙම වියදම් ප්‍රාග්ධනිත ගතකර ගිණුම් ගත කිරීමට කටයුතු කරන බව. | ප්‍රාග්ධන හා අයභාර වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම් තැබිය යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය රු.135,279,060ක් විය යුතු වුවද ප්‍රාග්ධන ප්‍රදාන රු.35,132,366 ක් හා ක්‍රමක්ෂය රු.3,741,444 ක් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට වැරදි සහගත ලෙස පිළිවෙලින් බැර හා හර කිරිම හේතුවෙන් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමේ ශේෂය රු.31,390,922 ක් අඩුවෙන් දැක්වුණි. එම වරද හේතුවෙන් ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම රු.35,132,366ක් අඩුවෙන් හා විලම්භිත ආදායම් ගිණුම රු.3,741,444ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | අධිකාරියට අයත් ගොඩනැගිල්ල ප්‍රත්‍යාගණනය කරන අවස්ථාව වන විට සම්පූර්ණයෙන් ක්ෂය වී අවසන් වී නොතිබුණි. එබැවින් ප්‍රත්‍යාගණනය කිරීමෙන් පසු වාර්ෂික ක්ෂයවීම් වලට සාපේක්ෂව ප්‍රාග්ධන සංචිත ක්‍රමක්ෂය කිරීමේදී ඇතිවන ගැටළුකාරී තත්ත්වය අවම කර ගැනීමේ අරමුණින් මෙලෙස සිදුකරන ලද බව. | ප්‍රත්‍යාගණන සංචිත ගිණුමට අදාල ගැලපීම් පමණක් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2010 වර්ෂයේ සිට වැඩ තහනමට ලක් වී සිටි ගණකාධිකාරීවරිය 2022 වර්ෂයේ නැවත සේවයේ පිහිටුවීම හේතුවෙන් ඇයට හිඟ වැටුප් ලෙස රු.8,781,059 ක මුදලක් ගෙවීමට සිදු වී තිබූ අතර ඒ සඳහා ප්‍රතිපාදනයන් මූල්‍ය ප්‍රකාශන වල සිදු කර නොතිබුණි. එම ගෙවිය යුතු හිඟ වැටුප් මුදලින් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවන ලද රු.4,027,143 ක මුදල රඳවා ගත් ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගැලපීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම තව දුරටත් ගෙවිය යුතු රු.4,753,916 ක් වූ හිඟ වැටුපට අදාලව මූල්‍ය ප්‍රකාශන තුළ වෙන් කිරීම් සිදු කර නොතිබුණි. | අධ්‍යක්ෂක මණ්ඩලයේ උපදෙස් පරිදි මෙම නිලධාරිනිය සම්බන්ධ අදාල නඩුවේ පිටපතක් ලබා ගැනීමෙන් පසු 2022 වර්ෂයේ මූලික විමර්ශනයක් සිදු කර ඇති බව. | පෙර වර්ෂවලට අදාල ගැලපීම් ප්‍රවර්තන වර්ෂයේ ලාභයට නොගැලපිය යුතු අතර අනාගත බැදීම් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කල යුතුය. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ රඳවාගත් ලාභ ගිණුම | **රු.1,289,179** | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ රඳවා ගත් ලාභයෙන් රු.1,289,179ක් ජාතික ළමා ආරක්ෂක අරමුදලට මාරුකර තිබුණද ඊට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන ගනුදෙනු සහ අරමුදලෙහි ගනුදෙනු සම්බන්ධයෙන් පිළියෙල කර ඇත්තේ එක් අවසාන ගිණුමක් බැවින් අරමුදලෙහි සහ අධිකාරියෙහි ගනුදෙනු වාර්ථා කිරීමේදී ගැටළු සහගත තත්ත්වයක් ඇතිවී ඇති බව විවිධ අවස්ථාවලදී නිරීක්ෂණය කරන ලදි. මෙම ගැටළුව දිගින් දිගටම පවත්වාගෙන යාම නුසුදුසු බැවින් මෙලෙස | රඳවාගත් ලාභ ගිණුම් අතර වෙනසට හේතු නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ගැලපීම් කර නිවැරදි කිරීම් සිදුකරන ලද බව. | |

## 1.6 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයතුළදී ක්‍රියාකාරී සැලැස්මේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත නිකුත් කළ අත්තිකාරම්වලින් එකතුව රු. 1,789,090 ක් එනම් සියයට 54 ක් භාවිතා නොකර නිශ්කාර්යව පැවතුණි. | අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ගිණුම් අංශය වෙත බිල්පත් හා හිඟ මුදල් තැපැල් මගින් යොමු කිරිම සම්බන්ධයෙන් යම් ප්‍රමාද වීමක් සිදුවීම මෙන්ම අයවැය චක්‍රලේඛ 08/2022 මගින් රාජ්‍ය ආයතන විසින් උත්සව සඳහා කරනු ලබන වියදම් අත්හිටවීම හා වෙනත් ප්‍රායෝගික කරුණු හේතුවෙන් සැලසුම් කළ වැඩසටහන් 2022 වර්ෂය තුළදී පැවැත්වීමට හැකියාවක් ලැබී නොමැති බව. | ලබා දී ඇති අත්තිකාරම් සම්බන්ධයෙන් පසුවිපරම් කර එම කාර්යයන් සිදු කරවීමට කළමනාකරණය නිසි පියවර ගත යුතුය |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූලනොවූ අවස්ථා පහතින් දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104 | 2021 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයෙන් හඳුනාගන්නා ලද අස්ථාන ගත වූ ලැප්ටොප් යන්ත්‍රය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ පිළිබඳව විමර්ශනයක් සිදුකිරීම සඳහා පත්කළ කමිටුවේ නිර්දේශ අනුව අස්ථානගත වූ ලැප්ටොප් පරිගණකයේ වටිනාකම සම්බන්ධ තක්සේරු වාර්තාවක් ලබා දෙන ලෙස තක්සේරු දෙපාර්තුමේන්තුව වෙත යොමු කර ඇත.වාර්තාව ලැබීමෙන් පසු ඉදිරි කටයුතු සිදුකිරිමට නියමිත බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 | (i) කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු 100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා දිය යුතු වුවද, එකී සීමාව ඉක්මවා අවස්ථා 06 කදී එකතුව 941,900 ක අත්තිකාරම් ලබා දී තිබුණි. | නොවැලැක්විය හැකි හදිසි අවස්ථාවන්වලදී දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා මෙම අත්තිකාරම් නිකුත් කර ඇත. ඉදිරියේදී මෙවැනි අවස්ථාවන්ද කළමනාකරණය කර රු.100,000 ඉක්මවා අත්තිකාරම් ලබා නොදීමට සියළු අංශ දැනුවත් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ii) නිකුත් කරන ලද අග්‍රිම පියවීම එය දෙන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවද, 2022 වර්ෂය තුලදී අවස්ථා 107 කදී නිකුත් කළ එකතුව රු.2,103,641 ක් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මෙම ගැටළුව අවම කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේද අනුමැතිය මත නව ක්‍රමවේදයක් හඳුන්වා දී 2023 වර්ෂයේ සිට ක්‍රියාත්මක කරගෙන යනු ලබයි. එබැවින් මෙම ගැටළුව ඉදිරියේදී ඇති නොවනු ඇතැයි අපේක්ෂා කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.10,255,584ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.826,262 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,429,322ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට පෙර වර්ෂ ගැලපීම් ප්‍රවර්ථන වර්ෂයේ ලාභයට ගැලපීම, ප්‍රාග්ධන වියදම් අයහාර වියදම් වශයෙන් ගැලපීම, සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික ප්‍රතිපාදනය සැලතිය යුතු අගයක් වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ රු.මිලියන 1.2 ක් වියදම් කර කොළඹ විශ්වවිද්‍යාලය මගින් ළමා අපචාර සම්බන්ධව සකස් කළ දත්ත පද්ධතිය ඵලදායී ලෙස භාවිතයට ගැනීමට නොහැකි වී ඇත. එබැවින් 2021 වර්ෂයේදී නව ජාතික දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය වෙත භාර දී තිබූ අතර එහි මුළු පිරිවැය රු.1,403,255 ක් විය. මේ හේතුවෙන් පැරණි දත්ත පද්ධතිය සඳහා වැය කළ රු.මිලියන 1.2 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. | යුනිසෙෆ් ආයතනයේ ප්‍රදානයක් ලෙස අධිකාරිය වෙත ලබා දුන් එම පද්ධතියේ ප්‍රසම්පාදන කටයුතු එම ආයතනය විසින් සිදු කළ බැවින්, ඒ සඳහා වූ රු.මිලියන 1.2 ක ගෙවීම යුනිසෙෆ් ආයතනය විසින් සෘජුව කොළඹ විශ්වවිද්‍යාලය වෙත ගෙවා ඇත. එම දත්ත පද්ධතිය භාවිතයට ගැනීම සම්බන්ධව ගන්නා ලද උත්සාහයේ අවසානයේ අධිකාරියේ පාලනයෙන් බැහැර තත්වයන් මතු වීම හේතුවෙන් ඒ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයට යොමු කළ අතර, ඒ අනුව ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය සමඟ නව දත්ත පද්ධතියක් සකස් කිරීම සඳහා 2021.06.17 දින පවත්වන ලද 205 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී තීරණය ලබා දී ඇති බව. | සැලසුම් සහගතව ව්‍යාපෘති ක්‍රියාත්මක කර මූල්‍ය සම්පත් අපතේ යාම වලක්වා ගත යුතුය. |

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ළමා අපචාර වැළැක්වීමේ කාර්ය සඳහා සහ එවැනි අපචාර වලට ගොදුරු වූවන් ආරක්ෂා කිරීම, ඔවුන්ගේ අයිතීන් රැක ගැනීම සහ ගතයුතු සියළු ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් 2010 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අරමුදල පිහිටුවා තිබුණ ද 2018 වර්ෂයේ සිට අරමුදලෙහි මුදල් අදාල අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් වැය කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන දින වන විට අරමුදලෙහි රු.2,905,500 ක ශේෂයක් පැවතිණි. | ජාතික ළමා ආරක්ෂක අරමුදලෙහි අරමුදල් අපේක්ෂිත අරමුණු සඳහා යොදාගැනීම සම්බන්ධයෙන් ඉහල කළමනාකාරිත්වය විසින් සාකච්ඡා කරන ලද අතර 2022 වර්ෂයේදී මෙම අරමුදල් භාවිතා කිරීමට අවකාශ නොලැබින. එහෙත් මෙම අරමුදලේ ක්‍රියාකාරකම් ක්‍රමවත් කිරීමට මාර්ගෝපදේශයක් සකස් කොට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය 2022 වර්ෂය තුල ගෙන ඇති බව. | අරමුදලේ පරමාර්ථ ඉටුකර ගැනීමට අරමුදල් යෙදවිය යුතුය. |

## 3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ජාතික ළමා ආරක්ෂක අධිකාරියට භාවිතයට ගන්නා ලෙස 2014 වර්ෂයේ සිට වාචිකව පවරන ලද මුලතිවු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ගොඩනැගිල්ල වාර්තාවේ දිනය දක්වාම කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණු අතර ආරක්ෂක සේවා ලබා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු. 865,680 ක් වැය කර තිබුණි. | මෙම ගොඩනැගිල්ල මුලතිවු රෝහල වෙත පැවරීමටත් එහි කොටසක අපයෝජනයට පත් වින්දිත දරුවන්ගේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම සඳහා වන ඒකකය පවත්වාගෙන යැමටත් තීරණය කර ඇති බවත්, නමුත් රාජ්‍ය වියදම් සීමාකිරීමට අදාලව නිකුත් කරනලද චක්‍රලේඛ අනුව බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි වී ඇති බව. | ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේදී වර්ෂ 30ක කල් බදු කාලයක් සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියට යාබද ඉඩම රු. 18,317,757 ක වටිනාකමකට කල් බදු ලබාගෙන තිබුණද එම ඉඩම මේ දක්වාම කිසිදු කාර්යයකට යොදා නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම සම්පත් කාර්යක්ෂමතාවයකින් යුතුව භාවිතා කිරිම සම්බන්ධයෙන් ඉදිරියේදි කටයුතු කිරිමට අපේක්ෂා කෙරේ. නමුත් මේ සඳහා අමාත්‍යාංශයෙන් මූලා ප්‍රතිපාදන ඉල්ලුම් කලද ප්‍රතිපාදන වෙන් කර නැති බව. | ඉඩම ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කල යුතුය. |

### 3.4 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ සහකාර කළමණාකරු(වැඩසටහන්) වසර 12 කට අධික කාලයක සිට බාහිර ආයතන සඳහා මුදා හැර තිබීම හේතුවෙන් මෙම තනතුර මඟින් ඉටු විය යුතු කාර්යයන් කාර්යක්ෂම අයුරින් ඉටු කිරීමට බාධාවක් වී තිබුණි. | මෙම නිලධාරිනිය දැරූ තනතුරේ ධූරකාලය අවසන් වීම හේතුවෙන් නැවත අධිකාරියේ නිත්‍ය තනතුරට වාර්තා කර ඇත. නැවත එම අමාත්‍යංශය පිහිටුවීමෙන් පසු නැවත මුදල්, ආර්ථික හා ස්ථායිකරණ, ජාතික ප්‍රතිපත්ති අමාත්‍යංශයේ ලේකම්ගේ නියෝගය මත 2022.09.15 දින මෙම නිලධාරිනිය මුදා හැර ඇති බව | මානව සම්පත් කළමනාකරණය විධිමත් පරිදි සිදු කළ යුතුය. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 618 ක් වුවද ඉන් නිළධාරීන් 287 ක එනම් සියයට 46 ක කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතුණි. ඉන් ළමා අපචාර සම්බන්ධයෙන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරන ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිළධාරීන් 148 දෙනෙකුගේ පුරප්පාඩු 2021 වර්ෂයේ සිට පැවතුණි. ඒ අනුව ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ මෙලෙස විශාල මානව සම්පත් හිඟයක් පැවතීම අධිකාරියේ කාර්යයන් ඉටු කිරීමට බාධාවක් වී තිබුණි. | පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගත් නිලධාරීන් සේවයෙන් ඉවත්වීම හා නව තනතුරු ඇතිකිරීම හේතුවෙන් තනතුරු පුරප්පාඩු වි ඇති අතර විශේෂ අනුමැතිය යටතේ බඳවා ගැනීම, වැඩබැලීමේ පදනම මත පත් කිරීම සහ පුරප්පාඩුව ඇති තනතුරු 17 ක බඳවා ගැනිම සඳහා අයදුම්පත් කැඳවා ඇති බව. | මානව සම්පත් කළමනාකරණය විධිමත් පරිදි සිදු කළ යුතුය. |

### 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීමඅ | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2019 ඔක්තෝබර් 29 දින අනුමැතිය ලැබී ඇති ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට අදාල පස් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි. | ළමා ආරක්ෂණය පිලිබඳ පස් අවුරුදු ක්‍රියාකාරී සැලසුම අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීම සඳහා අවසන් අදියරේ කටයුතු මේ වන විට සිදු කෙරෙමින් පවතින බව. | ළමා ආරක්ෂාව පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට කඩිනමින් පියවර ගත යුතුය. |
| (ආ) | ජාතික ළමා ආරක්ෂක අධිකාරියට 2021 ජනවාරි 01 සිට 2022 දෙසැම්බර් 31 දක්වා ලද පැමිණිලි අතුරින් 10,691 ක්, එනම් සියයට 47 ක් නොවිසඳුණු පැමිණිලි ලෙස පැවතුණු අතර විමර්ශන අංශය, මනෝ සමාජීය අංශය හා නීති අංශයට ලද පැමිණිළි අතරින් සියයට 50 කට අධික | පැමිණිල්ලක අවසන් ක්‍රියාමාර්ග ගැනීම යන්න පැමිණිල්ලේ ස්වරූපය අනුව වෙනස් වන අතර පැමිණිල්ලක විමර්ශන කාර්යයන් හෝ නඩු කටයුතු අවසන් නොවීම මත අදාළ පැමිණිලි අවසන් කළ පැමිණිල්ලක් ලෙස නොසලකන බැවින් තවදුරටත් | නොවිසිදී ඇති පැමිණිළි කඩිනමින් විසදීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණයක් විමර්ශනය වෙමින් පැවතුණි.සමාලෝචිත වර්ෂය තුල අපචාර හා හිංසන පැමිණිළි 10,497 ක් ලැබී තිබුණද ඉන් අපචාර 6731 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අවසන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | විමර්ශනය වෙමින් පවතින පැමිණිලි ලෙස ඉදිරියට ගෙන යමින් පවතින බව. | |
| (ඇ) | ආන්තික, අවදානම් සහගත, අවදානමට ලක්විය හැකි සහ ළමා අපයෝජනයට ගොදුරු වූවන් සඳහා අධ්‍යාපනික ආධාර හෝ අදාළ සහාය ලබාදීම සඳහා ළමුන් 1000 ක් ඉලක්ක කරගෙන සමාලෝචිත වර්ෂය තුළදී රු. 4,000,000 ක් වෙන් කර තිබුණද ළමුන් 417 දෙනෙකු සඳහා රු. 1,514,000 ක මුදලක් පමණක් ලබා දී තිබුණි. | මෙම වැඩසටහන යටතේ ආධාර ලබා දීම සිදු කරනුයේ 1929 පැමිණිලිවල හඳුනාගනු ලබන අධ්‍යාපන ආධාර අවශ්‍යතාවය පදනම් කර ගෙන වන අතර 2022 වර්ෂයේ දී ඒ ආකාරයට නිර්දේශ ලැබුණු ළමුන් 417 දෙනෙකු සඳහා පමණක් මෙම ආධාර යොමු කිරීමට සිදු වූ බව. | ඉලක්ක ගත ප්‍රතිලාභීන් සඳහා ක්‍රියාකාරී සැලැසුමට අනුව ආධාර ලබා දීමට කටයුතු කල යුතුය. |